සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**වර්ෂ අවසාන ඇගයීම - 2013**

28969

## 6 - ශ්‍රේණිය

## බුද්ධ ධර්මය

නම/විභාග අංකය:- ................................................................ කාලය: පැය 2යි.

### I කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුරට ලකුණු 02 බැගින් මුළු ලකුණු 40කි.**
- **පහත සඳහන් ප්‍රශ්නවල ඒ ඒ ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.**

---

(01) ජය ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව මහමෙවුනා උයනේ රෝපණය කරන ලද්දේ කිනම් පොහෝ දිනක ද?

1. ඇසළ පොහෝ දිනක.
2. උඳුවප් පොහෝ දිනක.
3. පොසොන් පොහෝ දිනක.
4. වෙසක් පොහෝ දිනක.

(02) බුදුරජාණන් වහන්සේ වැස්ස හඳුන්වා ඇත්තේ,

1. ස්වාභාවික සම්පතක් ලෙස ය.
2. මිතුරෙකු ලෙස ය.
3. දායාදයක් ලෙස ය.
4. උදවු කරුවෙකු ලෙස ය.

(03) අනුරාධපුර ථූපාරාම චෛත්‍යයෙහි නිධන් කොට ඇත්තේ බුදුරජාණන් වහන්සේගේ,

1. කේස ධාතු ය.
2. දකුණු දළදා වහන්සේ ය.
3. ලලාට ධාතු ය.
4. දකුණු අකු ධාතු ය.

(04) ලද දෙයින් සතුටු වීම උතුම් ගුණයකි. කරණීය මෙත්ත සූත්‍රයේ එය දක්වා ඇත්තේ,

1. සුභරෝ යනුවෙනි.
2. සන්තුස්සකෝ යනුවෙනි.
3. නිපකෝ යනුවෙනි .
4. සල්ලහුකවුත්ති යනුවෙනි.

(05) "ආයති සංවරය" යනු කුමක් ද?

1. වැරැදි නිවැරැදි කරගෙන සංවර වීම.
2. ඉන්ද්‍රිය සංවරය ඇති කර ගැනීම.
3. ගමන් බිමන් සංවරව කිරීම.
4. කය වචනය සංවර කර ගැනීම.

(06). බෞද්ධයන් හැටියට අප ත්‍රිවිධ රත්නය විශ්වාස කරන්නේ,

1. භක්තිය නිසා ය.
2. ශ්‍රද්ධාව නිසා ය.
3. ගෞරවය නිසා ය.
4. ආදරය නිසා ය.

(07) අද බොහෝ දෙනා අනුන් කරන දේ ඒ ආකාරයෙන්ම කිරීමට පෙළඹේ. අනවශ්‍ය බඩු භාණ්ඩ ගැනීමට ණය වීමට සිදුවේ. ණය ගෙවාගත නොහැකිව පීඩාවට ද පත් වේ. එසේ වන්නේ,

1. අනුකරණයට යෑම නිසා ය. 2. බඩුවලින් නිවස පුරවා ගැනීමේ ආශාව නිසා ය.
3. කැපී පෙනීමට ඇති ආශාව නිසා ය. 4. ආදායමට වඩා වැඩියෙන් වැය කිරීමට සිදු වන නිසා ය.

(08) "මහ රජ මේ ගස කුමක් ද? මේ හැර තවත් අඹ ගස් තිබේ ද?" යනුවෙන් මිහිඳු හිමියන් තිස්ස රජුගෙන් අසන ලද්දේ,

1. රජතුමා ගස් හඳුනන්නේදැයි දැන ගැනීමට. 2. වනය පිළිබඳ තොරතුරු දැන ගැනීමට.
3. මිහිඳු හිමි එම ගස් නොහඳුනන නිසා. 4. රජතුමා නුවණැති කෙනෙක්දැයි දැනගැනීමට.

(09) අප අකමැති දේට අන් අය ද අකමැති බව තේරුම්ගෙන වැරදි නොකර සිටීම,

1. ත්‍රිකෝටි පාරිශුද්ධි ශීලය යි . 2. ගෘහස්ථ ශීලය යි.
3. අත්තූපනායික ධර්මය යි. 4. චාරිත්‍ර ශීලය යි.

(10) අත්ථස්සද්වාර ජාතක කථාවෙන් අපට කියා දෙන්නේ,

1. දියුණු වීමේ රහස ගැනයි. 2. සිල් රැකීමේ අනුසස් ගැනයි.
3. කළ ගුණ සැළකීම ගැනයි. 4. වැඩිහිටියන්ට සැළකීම ගැනයි.

- පහත සඳහන් වාක්‍ය නිවැරදි නම් '✓' ලකුණ ද වැරදි නම් '×' ලකුණ ද යොදන්න.

11. තමාගේ තරාතිරම, පරපුර ආදිය සලකා වැරදි වැඩවලින් මිදීම අත්තාධිපතෙය්‍ය නම් වේ. ( )
12. කිසිම දෙයක් ස්ථිර නැති බව අනාත්ම නම් වේ. ( )
13. බුදුරජාණන් වහන්සේ තමා දුෂ්කර ක්‍රියා කළ ආකාරය බෝධි රාජ කුමාරයාට විස්තර කළහ. ( )
14. බුදුරජාණන් වහන්සේ දිනය කොටස් හයකට බෙදාගත් දින චරියාවක් අනුගමනය කළහ. ( )
15. "ඥාන වෘද්ධ" යනු වයසින් වැඩි කෙනා ය. ( )

- A කොටසට ගැළපෙන පදයක් B කොටසේ ඇත. එය තෝරා යා කරන්න.

| | A | B |
|---|---|---|
| 16. | රාහුල හාමුදුරුවෝ | කුම්භඝෝෂක |
| 17. | සිඟාලෝවාද සූත්‍රය | ගෙවතු උයන් ඉදිකිරීම |
| 18. | වනරෝප සූත්‍රය | දේවානම්පියතිස්ස රජතුමා |
| 19. | මහින්දාගමනය | සැරියුත් හිමි |
| 20. | අභිවාතක රෝගය | සදිසා නමස්කාරය |

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20කි. අනෙක් ප්‍රශ්නවලට 10 බැගිනි.**

---

01. 6 ශ්‍රේණිය තුන් වැනි වාරයේ අනිවාර්ය ඇගයීම වූ පන්තියේ සකස් කරන ලද බිත්ති පුවත්පතට අදාළව පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

i. බිත්ති පුවත්පත සකස් කිරීම සඳහා යොදාගත් පාඩම් දෙකෙහි නම ලියන්න.

ii. බිත්ති පුවත්පත සකස් කිරීමේ දී ලැබුණු ගුරු උපදෙස් දෙකක් ලියන්න.

iii. බිත්ති පුවත්පත සඳහා ඔබ ඉදිරිපත් කළ නිර්මාණය කුමක් ද?

iv. බිත්ති පුවත්පත සකස් කිරීමේ දී ඔබ හෝ ඔබ කණ්ඩායම මුහුණ දුන් ගැටලු දෙකක් ලියන්න.

v. ඔබ ලබාගත් ඉගෙනුම් අත්දකීම් දෙකක් දක්වන්න.

vi. ''සන්තුස්සකෝ'' ''සුභරෝ'' යන පාඨ දෙකෙහි තේරුම ලියන්න.

vii. චාම්, සරල ජීවිතයක් ගත කරන කෙනෙකුගේ ලක්ෂණ දෙකක් දක්වන්න.

viii. ස්වර්ණ හංස ජාතකයේ සඳහන් වන දරු දෙදෙනෙකුගේ නම් ලියන්න.

ix. හංසයා පිහාටු ලබා දුන්නේ ඇයි?

x. ස්වර්ණ හංස ජාතකයෙන් ගත හැකි උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 2×10=20)

02.

i. '' මහණ ඔහොම නවතින්න'' මෙසේ ප්‍රකාශ කළේ කවුරුන් ද? (ලකුණු 02)

ii. '' මම නැවතී සිටිමි. ඔබ ද නවතින්න.'' මෙහි **නැවතී සිටිමි** යන්නෙන් කියැවෙන්නේ කුමක් ද?
1. (ලකුණු 03)

iii තමා අතින් යම් වැරැද්දක් මුල දී සිදු වුවත් වැරැදි නිවැරැදි කරගෙන යහපත් අයෙකු විය හැකි ආකාරය පහදන්න. (ලකුණු 05)

03.

i. කුසල මූල තුනෙන් දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. කැඩපත උපමා කරගෙන බුදුරදුන් රාහුල හිමියන්ට පැහැදිලි කරන ලද්දේ කුමක් ද? (ලකුණු 03)

iii. රාහුල හිමියන්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ පෙළ ගස්වන්න. (ලකුණු 05)

04.

i. සිදුහත් බෝසතාණන්ගේ මුල් ගුරුවරු දෙදෙනා නම් කරන්න. (ලකුණු 02)

ii. දස මාර සේනාවෙන් තුනක් නම් කරන්න. (ලකුණු 03)

iii. සිදුහත් බෝසතාණන්ගේ දුෂ්කර ක්‍රියාව කෙටියෙන් දක්වන්න. (ලකුණු 05)

05.

i. බුදුගුණ අලංකාරය කවි පොත ලියන ලද්දේ කවුරුන් විසින් ද? (ලකුණු 02)

ii. එහි විස්තර වන්නේ කුමක් ගැන ද? (ලකුණු 03)

iii. එහි සඳහන් ඔබ දන්නා එක් කවියක් ලියන්න. (ලකුණු 05)

06.

i. බුදුරදුන්ගේ ඥාති සම්බන්ධය නිසා මහත් උඩඟු බවට පත් භික්ෂූන් වහන්සේ කවු ද? (ලකුණු 02)

ii. උන් වහන්සේගේ නොමනා හැසිරීම කුමක් ද? (ලකුණු 03)

iii. "නහී වේරේන වේරානී" යන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 05)

07.

i. සතර බ්‍රහ්ම විහරණවලින් තුනක් ලියන්න. (ලකුණු 02)

ii. දරුවන් විසින් දෙමවුපියන්ට ඉටු කළ යුතු යුතුකම් තුනක් ලියන්න. (ලකුණු 03)

iii. දෙමවුපියන් විසින් දරුවන්ට සැලකිය යුතු ආකාර පහ දක්වන්න. (ලකුණු 05)

..........